**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020පෙබරවාරි 27දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව2020 ජුනි 17 දින දවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.2,442,485 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙනස්වීම් සොයාගත් වහා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | රු. 157,862,974 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාළව හිමිකම් සහතික සහ යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍යප්‍රකාශනවලදැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි, ලී බඩු සහ උපකරණ හා වාහන පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛන සියල්ල යාවත්කාලීන කර ඇති බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

---------------------

## 1.4.1 නීති,රීති,රෙගුලාසි කළමනාකරණ තීරණවලට යොමුව

------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ154(1) වගන්තිය | ඉඩම් කට්ටි කර විකිණීමේදී විකුණුම් මිලෙන් සියයට 1 ක් අයකර ගත යුතු වුවද, ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් සියයට 1 ක් පමණක් අයකරගෙන තිබුණි. | විකුණුම් වාර්තා අනුව ඉතිරි බදු මුදල් අයකර ගත යුතුවේ. | ආයතන විසින් ලබාදෙන විකුණුම් විස්තරයන් ආදායම් පරීක්ෂක මහතා වෙත ඉදිරිපත් කර සභාව වෙත අයකර ගත යුතු හිඟ 1%ක බදු මුදලක් ඇත්නම් නැවත අයකර ගැනීමට කටයුතු කරනු ලබයි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) අංක 5(6) රීතිය | නියමිත කාලසීමාව තුළදී අයවිය යුතු සියලු ආදායම් හා වෙනත් ගාස්තු එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව රතු නිවේදන, දේපල තහනම් කිරීම වැනි කටයුතු සිදු කළ අතර, අනෙකුත් ආදායම්ද, නීත්‍යානුකූලව අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| | (ii) අංක 218 රීතිය | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීම සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කළ යුතුවේ. | 2020 අයවැයෙන් සභා ඉඩම් වටා අළුත් කම්බි ගැසීම සඳහා රුපියල් ලක්ෂ 08ක ප්‍රතිපාදන ඇත. සභා ඉඩම් නඩත්තුව සඳහා රුපියල් ලක්ෂයක මුදලක් වෙන්කර ඇත. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 30,524,374 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 27,297,032 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2019 වර්ෂය** | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 4,155,000 | 4,449,854 | 3,994,856 | 2,568,465 | 3,826,000 | 4,243,838 | 3,929,859 | 2,113,468 |
| II. | බදු කුලී | 12,093,200 | 11,949,049 | 11,951,499 | 24,011 | 12,766,000 | 11,820,172 | 11,931,117 | 26,461 |
| III. | බලපත්‍ර ගාස්තු | 843,050 | 1,256,605 | 1,256,605 | - | 747,550 | 800,030 | 800,030 | - |
| IV. | වෙනත් ආදායම් | 92,508,450 | 88,932,213 | 101,838,839 | 62,468,755 | 72,951,650 | 79,681,990 | 102,980,349 | 69,641,885 |
| | එකතුව | 109,599,700 | 106,587,721 | 119,041,799 | 65,061,231 | 90,291,200 | 96,546,030 | 119,641,355 | 71,781,814 |

### 2.2.2 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති වරිපනම් බදු හා අක්කර බදු හිඟයෙන් 2020 ජූනි 26 දින වන විට වරිපනම් හිඟයෙන් රු. 2,201,647 ක් හා අක්කර බදු හිඟයෙන් රු. 60,383 ක් තවදුරටත් අයකර ගැනීමට පැවතුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 2,654,137 හා රු. 51,030,600 ක් විය. | හිඟ මුදල් ලබාගත යුතුවේ. | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් වරින් වර ඉල්ලීම් සිදුකරනු ලබන අතර, අවසාන වශයෙන් 2020 මාර්තු 31 දිනට අදාළ මුද්දර ගාස්තු හා උසාවි දඩවලට අදාළවද, ඉල්ලීම් සිදු කර ඇති අතර, ඒ අනුව මුදල් ලැබෙමින් පවතින බව දන්වමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණි. | නව විෂයන්ට අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමේ කටයුතු සිදුකළ යුතුවේ. | මේ වන විට පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන ඇති අතර නව අතුරු ව්‍යවස්ථා සභාව විසින් සඳා නොමැත. ත්‍රීවීල් රථ පොළවල් විධිමත් කිරීම සඳහා වාහන නවතා තැබීම යන සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව ද, දැන්වීම් පුවරු සඳහා ප්‍රචාරක දැන්වීම්/ දෘෂ්‍ය පරිසරය යන සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේද සුසාන භූමි සඳහා සුසාන භූමි සම්බන්ධ සම්මත අතුරු ව්‍යවස්ථාව අනුවද කටයුතු කරනු ලබයි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු කරන ලද කසළ වෙන්කිරීම් නොකර කැන්දයාවත්ත කසළ වෙන්කිරීමේ ගොඩනැගිල්ල පිටුපස විවෘත භූමියට බැහැර කිරීමට කටයුතු කර තිබුණි. | කසළ විවෘතව බැහැර නොකළ යුතුවේ. | මේ වන විට නොදිරන කසළ ගබඩා කිරීමේ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසාන වෙමින් පවතින අතර, බේල් මැෂිමද සවිකර නොදිරන ද්‍රව්‍ය ඉන්සි ආයතනය වෙත භාරදීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සහිත වැඩ සටහන් සැලසුම් කර තිබුණද ඉලක්ක, ජයග්‍රහණ දර්ශක හා වර්ෂ අවසානයේ ප්‍රගතිය මිනුම් කර නොතිබුණි. | තිරසර සංවර්ධන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | නමුදු 2021 අයවැය ප්‍රකාශය තුළ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා දර්ශක හඳුනා ගැනීමටත් ඒ අනුව ප්‍රගතිය මිනුම් කිරීමටත් කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීම්, නොපවරා ගැනීම්, සහතික නිකුත් කිරීම්, වීථි පහන් අළුත්වැඩියා කිරීම්, අනතුරුදායක ගස් කැපීම, අනුකූල හා සහතික නිකුත් කිරීම හා එවැනි අනෙකුත් සේවා සැපයීමේ ඉලක්ක පුරවැසි ප්‍රඥප්තිය යටතේ ප්‍රදර්ශනය කර තිබුණද එම ඉලක්ක ළඟාකර ගැනීමට හැකි ආකාරයට සේවා සැපයුම් ක්‍රියාවලි සැලසුම් කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක ළඟා නොවූ අවස්ථා පැවතුණි. | පුරවැසි ප්‍රඥප්තියේ සඳහන් ඉලක්ක ළඟාකර ගැනීමට හැකි පරිදි සැලසුම් සකස්කර ගත යුතුවේ. | පුරවැසි ප්‍රඥප්තියේ ඉලක්ක සඳහන් වුවද, හැකි සෑම අවස්ථාවකම එම දිනයටම සේවාව සිදු කර ලබාදීමට උත්සාහ ගන්නා බවද දන්වමි. |
| (ආ) | 2007 වර්ෂයේ දී උඩුබද්දාව නගරයේ නව සභා කාර්යාලය ඉදිරිපිට තෙමහල් ගොඩනැගිල්ලක් අනුමත ගොඩනැගිලි සීමා උල්ලංඝණය කරමින් ඉදිකර තිබුණද මේ දක්වා සභාව කිසිදු නීත්‍යානුකූලව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2019 දෙසැම්බර් 12 වන විට මහල් 03 ම ඉදිකර ගොඩනැගිල්ල භාවිතා කරමින් තිබූ අතර එම අනවසර ඉදිකිරීම සඳහා 2015 ජුනි 09 දින අනුකූලතා සහතිකයක්ද ලබා දී තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කාර්යක්ෂම හා සාධාරණ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුවේ. | විගණනයෙන් පෙන්වා දුන් කරුණු සියල්ල සත්‍ය බව පිළිගනිමි. මෙය වසර 12 ක් වැනි දීර්ඝ කාලයක සිදුවීමකි. මෙම ගැටළුව සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් විමර්ශනයක් සිදු කර ඇත. එකී විමර්ශන වාර්තවේ නිර්දේශයට අනුව 2007/72 ගොඩනැගිලි සැලසුමට අදාළව ලබාදී තිබූ අනුකූලතා සහතිකය 2020 මාර්තු 03 දින සිට අවලංගු කර ඇති බව ගොඩනැගිල්ලේ වර්තමාන හිමිකරු වෙත දැනුම්දී ඇත. මේ වන විට තොරතුරු පනත මඟින් ද, විමසා ඇති තොරතුරුවලින් 95% කට වැඩි ප්‍රමාණයක් සඳහා පිළිතුරු සපයා ඇති බවද දන්වමි. |
| (ඇ) | පළුගමුව, දුම්මලසූරිය, කජු ගහමුල හේන කොටස් කරන ලද ඉඩමේ ගොඩනැගිලි සීමා උල්ලංඝනය කරමින් මහල් 02 කින් යුත්ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුණි.අනුමත සැලසුමට අනුකූල නොවූ අනවසර කොටස් ඉදිකිරීම හේතුවෙන් අසල මාර්ගයේ ජලය එක්රැස් වී ඩෙංගු මදුරුවන්ට සුදුසු පරිසරයක් දගොඩනැගී තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඒ අනුව අංක 04/08/49 හා 2020 ජනවාරි 13 දිනැති ලිපිය මඟින් අනවසරව ඉදිකර ඇති කොටස් එම ලිපිය ලැබී දින 14ක් ඇතුළත ඉවත් කරන ලෙස දන්වා යවන ලදි.<br>මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බැවින්,එළඹෙන මහ සභාවට යොමු කර මේ සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගෙන නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබියයුතු ගිණුම් ශේෂයේ ඇතුළත් රු.25,083,780 ක් වර්ෂ 01 සිට03 දක්වා කාලයකට දරු.4,602,074 ක් වර්ෂ 03 කට වැඩි කාලයකටද අදාළ විය. | තවදුරටත් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකමින් වර්ෂ 01 සිට03 දක්වා කාලයකට අදාළ රු.1,022,146 ක්වර්ෂ 03 ට වැඩි රු.409,040ක්හා කාලවිශ්ලේෂණයක් සොයාගත නොහැකි රු.1,431,960 ක් ද පැවතුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂයකට වඩා අඩු කාලයක ණයහිමියන් ගෙවා නිදහස් කරමින් පවතින අතර ඒ අනුව කර්මාන්ත ණයහිමියන්ද ගෙවා නිදහස් කරමින් පවතින බව දන්වා සිටිමි. තවද තැන්පත්වලට අදාලවද ඒවායේ කාලවිශ්ලේෂණයට අනුව ගෙවීම් මේ වන විටත් සිදු කරමින් පවතින බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පුරප්පාඩු 19 ක් හාඅතිරික්ත 03 ක් පැවතුණි. | අත්‍යාවශ්‍යපුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හාඅතිරික්ත විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු තනතුරු සඳහා සේවකයන් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇතත්, සේවක හිඟය මත මෙතෙක් එම සේවයන් ලබාදී නැත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.145,400 ක් වූ මෝටර් ග්‍රේඩරය හා වටිනාකම රු.60,600 ක් වූ කෘa කැබ් රථය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ මෙම මෝටර්ග්‍රේඩරය හා කෘa කැබ් රථය පවරා ගැනීමට අමාත්‍යාංශය වෙත අදාළ ලිපි ඉදිරිපත් කරන ලදි. |

### 3.4.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට වටිනාකම සඳහන් නොවූ ජල බවුසරයක් හා ට්‍රැක්ටර් ටේලරයක් නිශ්ක්‍රීයව පැවතුණි. | ඵලදායී භාවිතයකට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුවේ. | මෙම ටේලර් රථය හා ජල බවුසරය ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වී තිබූ බැවින්, එය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ නිරීක්ෂණ ලබාගැනීමට කටයුතු කරමින් පවති. |
| (ආ) | අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අංගනය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | ඵලදායී භාවිතයකට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුවේ. | බදුදීමේ කටයුතු සඳහා එම ව්‍යාපෘතිය පිහිටි භූමි ප්‍රමාණය මිණුම් කටයුතු සිදු කර සැලැස්මක් සකස් කර ඉදිරි කටයුතු සිදු කරමින් ඉදිරියේදී බදුදීමට කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වමි. |

## 3.5 ප්‍රසම්පාදනය

--------------

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හා ඊට උපකාරක ලෙස ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාලසටහනක් සකස් කළ යුතුවේ. | 2019 වර්ෂයේ ජුනි මාසය දක්වා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව දන්වමි. |